**ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) දිළිඳුකම අඩු කිරිම සඳහා වන මුල පිරිම,

(ආ) මැතිවරණ සම්බන්ධීකරණය,

(ඇ) සංවර්ධන ව්‍යාපෘති සැලැසුම් කිරිම හා අධික්ෂණය,

(ඈ) ආපදා සහන ව්‍යාපෘතින් හා පුනරුත්ථාපන ව්‍යාපෘතින් පරිපාලනය,

(ඉ) දිස්ත්‍රික් ව්‍යාපෘතින් පරිපාලනය, මග පෙන්වීම හා ආදායම් එකතු කිරිම.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

| | | |
|---|---|---|
| (අ) සීතාවක | (ඉ) මොරටුව | (එ) ශ්‍රී ජයවර්ධනපුර |
| (ආ) පාදුක්ක | (ඊ) දෙහිවල | (ඒ) කැස්බෑව |
| (ඇ) රත්මලාන | (උ) කඩුවෙල | (ඔ) හෝමාගම |
| (ඈ) මහරගම | (ඌ) කොළඹ | (ඕ) කොලොන්නාව |
| | | (ක) තිඹිරිගස්යාය. |

## 1.3 විගණන විෂය පථය

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 22 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරික්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන් , වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

---------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) විගණන සාක්ෂි නොවීම

---------------------------

කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංචිත වාහනයකට අදාලව 2012 ජුනි සිට 2013 දෙසැම්බර් දක්වා වූ ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### (ආ) විසර්ජන ගිණුම

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (i) මුළු ප්‍රතිපාදනය හා වියදම

-----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.846,591,306 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.843,796,773 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.2,794,533 ක් හෙවත් සියයට 0.33 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 616,341,306 | 615,359,575 | 981,731 | 0.16 |
| මූලධන | 230,250,000 | 228,437,198 | 1,812,802 | 0.08 |
| එකතුව | 846,591,306 | 843,796,773 | 2,794,533 | 0.33 |

(ii) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 25 කින් හා දෙපාර්තමේන්තු 14 කින් පිළිවෙලින් රු.1,442,468,250 හා රු.557,617,803 වශයෙන් එකතුව රු.2,000,086,053 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබූ අතර එම ප්‍රතිපාදන පිළිවෙලින් රු. 1,330,059,188 ක් හා රු.547,623,221 ක් වශයෙන් එකතුව රු.1,877,682,409 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් පිළිවෙලින් රු.112,409,062 ක් හා රු.9,994,582 ක් වශයෙන් එකතුව රු. 122,403,644 ක්වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි . එම ඉතිරිවීම් ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 2 ත් සියයට 8 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2013 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් රු.1,000 බැගින් වූ වැඩිහිටි දීමනා තැපැල් කාර්යාල මගින් ආධාරලාභීන්ට ගෙවීම සඳහා 2013 වර්ෂයේදී එකතුව රු.4,906,000 ක් වැය කර තිබුණි. ප්‍රතිලාභීන්ට ගෙවීම් කිරීමේදී ලබා ගන්නා ලද අත්සන් ලැයිස්තු හා ලේඛනවල සඳහන් අත්සන්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
- ගම නැගුම ව්‍යාපෘතිය යටතේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 03 ක් ගිවිසුම් අත්සන කළ දින සිට මාස 03 ක්

ඇතුළත නිම කළ යුතු වුවත්, ව්‍යාපෘති 03 සති 12 ක්, සති 20 ක් හා සති 68 ක් ප්‍රමාද වී නිම කර තිබුණි. එළඹ තිබුණු ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාදවන සතියක කාලයක් සඳහා රු.150 ක ප්‍රමාද ගාස්තු අය කළ යුතු වුවත්, කාර්යාලය විසින් එම ව්‍යාපෘති 03 ට අදාලව ප්‍රමාද ගාස්තු ලෙස රු.15,000 ක් අයකර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම් | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු | රු. | රු. | රු. | රු. |
| 25501 | 47,000,000 | 35,065,689 | 34,000,000 | 35,630,330 | 200,000,000 | 158,872,014 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 25501 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.5,233,251 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) දෙපාර්තමේන්තු පොත් අනුව 2013 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.158,872,014 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු.158,844,948.26 ක් විය. මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාරයේ පොත් සමඟ සසඳා නොතිබුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට අංක 6003/0000/00/0031/0000/000 දරන තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු.515,745,081 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) ගිණුම් අංක 6003/0000/00/0001/0000/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂයක් නොතිබුණු අතර භාණ්ඩාගාර පොත් අනුව රු. 10,000,000 ක හර ශේෂයක් පැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමට අනුව අංක 6003/0000/00/0031/0000/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 515,745,081 ක් ලෙස දක්වා තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි පොදු තැන්පත් ලෙජරය අනුව ශේෂ එකතුව රු.503,999,218 ක් වී තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 565 ප්‍රකාරව පොදු තැන්පත් ලෙජරය පවත්වා නොතිබුණි.

(iv) පොදු තැන්පත් ගිණුමේ දැක්වෙන රු.515,745,081 ක් වූ ශේෂයට අදාල කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 03 ක් වසර 02 ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

### (ආ) බේරුම් නොකළ බැරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.7,553,715 ක් වූ අතර, එම බැරකම් වර්ෂයක අඩු කාලයක සිය පැවත එන ශේෂ විය.

(ii) වැය විෂයයන් 08 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය රු.19,144 ක් වී තිබුණත්, මුදල් රෙගුලාසි 94 ට පටහැනිව එම ඉතිරිය ඉ ක්මවා රු.765,759 ක බැරකම්වලට එළඹ තිබුණි.

1.7 අනුකූල නොවීම්

--------------------

නියැදි විගණන පරික්ෂණවලදී නිරික්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 104 | - 15,000 | කාර්යාලයේ කැබ් රථ 02 කට 2012 අප්‍රේල් 04 දින හා 2013 මැයි 28 දින සිදුවූ අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 110 | | කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| **(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | | කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛ ය | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව පවතින සියළුම පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**(ඇ) ජාතික අයවැය චක්‍රලේඛ**

| | |
|---|---|
| 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන චක්‍රලේඛය | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |

## 1.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලංකා බැංකු ජංගම ගිණුමේ 2013 අප්‍රියෙල් 01 දින රු.151,000 ක චෙක්පතක් ලැබී එය නිශ්කාෂණය වී ආදායමට ගෙන තිබුණත්, 2014 අප්‍රියෙල් මස බැංකු සැසඳුම් ප්‍රකාශයේ එම වටිනාකම නිෂ්කාශණය නොවූ චෙක්පතක් ලෙස දක්වා තිබුණි. කාර්යාලය විසින් පිළියෙල කර තිබුණු සැසඳුම් ප්‍රකාශන නිවැරදි නොවීම නිසා එය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

(ආ) කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වු තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය<br>මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | එකතුව |
|---|---|---|---|
| | | රු. | රු |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | 151,000 | 151,000 |
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 105,006,934 | 105,006,934 |

## 1.9 පාඩු හා හානි

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) විසර්ජන ගිණුමේ දැක්වෙන රු.100,094 ක්වූ හානි හා පාඩු 06 ක් සිදු වී වසර 10 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණත් මුදල් රෙගුලාසි පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) අවුරුදු 05 ට අඩු රු. 197,000 ක් හා අවුරුදු 5-10 ත් අතර රු. 163,716 ක් වූ සිද්ධීන් 06 කට අදාල හානි හා පාඩු සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ දක්වා තිබුණත් 2014 ජුනි 25 වන විටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 සැප්තැම්බර් 17 දින විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම මගින් කපා හැරීමට තීරණය කර තිබුණු රු. 15,536 ක් වූ සිද්ධි 05 කට අදාල පාඩු මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව පොත් වලින් ඉවත් කිරීමට කටයුතු නොකර තව දුරටත් ගිණුම්වල හානි හා පාඩු යටතේ දක්වා තිබුණි.

(ඈ) 2013 මැයි 28 දින කැබ් රථය අනතුරට ලක්වීමෙන් සිදු වූ රු.15,500 ක් වූ අලාභය අලාභහානි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

## 1.10 කළමනාකරණ දුර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන සඳහා ඉන්ධන ලබා ගැනීම ඉන්ධන ඇණවුම් භාවිතා නොකර මුදලින් ලබා ගෙන තිබුණි.

(ආ) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ධාවන සටහන්පත් නිසි පරිදි ලිවීම සිදු නොකරන බවත්, ධාවන සටහන් පත් මගින් වාහන පිලිබඳව පවතින අභ්‍යන්තර පාලන පද්ධතිය සතුටුදායක ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.

1.11 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

----------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යව | තථ්‍ය සේවක සංඛ්‍යව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 63 | 62 | 03 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 24 | 18 | 06 | -- |
| (iii) | ද්විතියක මට්ටම | 1106 | 872 | 239 | 05 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 136 | 124 | 12 | -- |
| | එකතුව | 1329 | 1076 | 260 | 07 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 260 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(ආ) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.